25/07/2010 - ඉරිදා ලංකාදීප

**දශක තුනක විනාශය වෙනුවට අග නගරයක් විය යුතු ත්‍රිකුණාමලය - මිලින්ද මොරගොඩ**

අවුරුදු දෙදහස් පන්සියයක් තිස්සේ ලංකාව එක් සේසත් කළ රජවරු ස්වකීය රාජධානි රටේ තැනින් තැනට ගෙන ගියහ. අනුරාධපුරය, පොළොන්නරුව සිට කෝට්ටේ දක්වා මෙම යුග පරිච්ඡේද වලට වෙන්කර තිබේ. මෙම යුගවලදී සිය රාජධානිය වටා සම්පූර්ණ ලංකාවම පාලනය කරන්නට සමත් වූ රජවරු අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශීය රජවරුන්ට බලය පැවරූහ. අමාත්‍යවරු පත් කළහ. දක්ෂ නිර්මාණශීලී පුද්ගලයන්ට ඉරහඳ පවතිනතුරු අයිතිය ඇති ගම්වර තෑගි කළහ. ප්‍රතිවාදීන් හා සටන් කළහ. ආරක්ෂාව ගැන සැලකිලිමත් වූහ. රාජකීයත්වය සමග ලංකාවේ සංස්කෘතිය හා අනන්‍යතාවය ආරක්ෂා කළහ. සියවස් ගණනකට පසු ආපසු හැරී බලන ඉතිහාසය රජවරුන්ගේ ක්‍රියාකලාපය හා ඔවුන් කළ කී දේ අගය කරති.

ඉතිහාසයේ රාජ්‍ය පාලනය තැනින් තැනට ගියේ ඇයි? එය එදා යුගයේ අවශ්‍යතාවයයි. බාහිර ආක්‍රමණ සිදුවන අවස්ථාවේ බලය ආරක්ෂා කර ගැනීම එහි පළමු අරමුණයි. දෙවැනුව වැව් හා දාගැබ් තනා කෘෂිකර්මය නැංවීමයි. රජවරු රටේ තැනින් තැනට සිය පාලන බලය අවස්ථාවෝචිතව ගෙන ගිය හෙයින් රට හැම තැනෙකම රජවරුන් නිසා අලුත් නගර බිහිවී තිබේ. මේ නගර ඔස්සේ නව ආර්ථිකයක් ඇතිවිය. අභ්‍යන්තර ප්‍රවාහනය හා සන්නිවේදනය වර්තමානය තරම් දියුණු නැති එම යුගයේ ගම් දනව් දියුණුවට පත්ව ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූයේ රට තැනින් තැන අවශ්‍ය පරිදි ආර්ථික හා කෘෂි කලාප බිහිකිරීමෙනි. තොරතුරු තාක්ෂණ යුගයේ දී මෙහෙයැවීම ඕනෑම තැනක සිට සිදුවිය හැකි නමුත් සම්පත් පවතින විට එය වෙනස් පසුබිමකි.

පැරණි ලාංකිකයන් අසල්වැසි රාජ්‍ය සමග නොයෙකුත් ආකාරයෙන් සබඳතා පවත්වා තිබේ. ආගමික, දූත හුවමාරුව හා වෙළඳාම වශයෙන් මේවා එකිනෙකයට වෙනස්ය. මුහුදු මාර්ගයෙන් රට වඩා සම්බන්ධ වී ඇත්තේ නැගෙනහිර පලාත සමගයි. විදේශ වලින් පැමිණි වෙළඳ හා වෙනත් නියෝජිතයන් රැගත් නැව් ලංකාව හා බහුලව ගනුදෙනු කර ඇත්තේ දිවයිනේ නැගෙනහිර පෙදෙසින් බව පෙනේ. අනන්‍යතාවය ආරක්ෂා කරගෙන විදේශ රටවලින් තාක්ෂණය හා ශිල්පීය දක්ෂතා උකහා ගන්නට ලාංකිකයන් සමත්වූ බව අපේ දේශීය උරුමය පෙන්වා දෙයි. ඉන්දියාව, ඉරානය, ඇෆ්ගනිස්ථානය හා චීනය වැනි රටවලින් විශේෂයෙන් වාරි කර්මාන්තය, කලා ශිල්ප දියුණුව හා වෙළඳාම වෙනුවෙන් මෙරටට පැමිණ ඇත. මෙම ක්‍රියාදාමය රටේ ආර්ථිකයට බලපා තිබේ. විශාල ඉදිකිරීම් සඳහා ශ්‍රමය ප්‍රයෝජනයට ගැනීම, ඒ වෙනුවෙන් ගෙවීම්, බදු අයකිරීම, මෙම ඉදිකිරීම් වෙනුවෙන් සේවා සැපයීම හරහා ආර්ථික ප්‍රසාරණයක් සිදුවිය. එයින් ධනය බිහිවූ අතර එය එදා තිබුණ පාලන රටාව අනුව ධනය හා රාජ්‍යත්වය අතර තිබුණ සම්බන්ධයයි. අධිරාජ්‍යවාදීන් ලංකාව යටත් කර ගැනීමෙන් පසු සිය පාලනයට ගත්තේ මෙම ධනය බිහිවන යාන්ත්‍රණයයි. බලපත්‍ර නිකුත් කිරීම, බදු අයකිරීම වෙළඳාම ඇතුලු සියලු දේ ඔවුන්වෙත පවරා ගත් අතර එය ලංකාවේ ආර්ථික ශක්තිය අධිරාජ්‍යවාදීන්ට හිමිවීමයි.

දශක තුනකට පසු ශ්‍රී ලංකාව තමන්ගේ උරුමය හා අතීත අත්දැකීම් වලින් පන්නරය ලබා අනාගතය දෙස බැලිය යුතු අවස්ථාව උදා වී තිබේ. අධිරාජ්‍යවාදීන් විසින් ස්වකීය උවමනාව වෙනුවෙන් බිහිකළ රාමුවෙන් පිටට පැමිණ ශ්‍රී ලාංකික ආර්ථිකයක් බිහි කරන්නට නම් අතීත උරුමය හා වර්තමාන ලෝක අවශ්‍යතා එකට ගලපා ගත යුතුය. රටක් වශයෙන් අතීතයේ හිමිකරගෙන තිබුණ ආර්ථික බලය යටත් විජිත පාලකයන් විසින් වෙනස් කරන ලද්දේ ස්වදේශිකයන් අසරණ කරමින්ය. එය ආපසු හැරවිය හැක්කේ අධිරාජ්‍යවාදීන් ස්ථාපිත කළ ඔවුන්ගේ පාලන රාමුව වෙනුවට අපට ගැලපෙන ආර්ථිකයක් බිහිකිරීමෙන් පමණකි. මේ උදෙසා ත්‍රිකුණාමලය වැදගත් සාධකයකි. සාමකාමී වාතාවරණය ඇතිවීම සමග මෙතෙක් අවධානය යොමු නොකළ පැති අලුතින් හදාරන්නට රටට අවස්ථාව තිබේ. අප දැන් පසු කරමින් සිටින්නේ අන්තර් අවධියකි.

රටේ අගනුවර ජයවර්ධන පුරයම විය යුතුද? ලංකාවේ ආර්ථිකය පුබුදුවන්නට නම් සියලු වැඩසටහන් දියත්විය යුත්තේ කොළඹ කේන්ද්‍ර කර ගනිමින්ද? විචාරකයෙකුට එසේ ප්‍රශ්න කළ හැකිය. ඓතිහාසික

ලංකාවේ අගනුවර තීන්දු වී ඇත්තේ ආරක්ෂාව අනුවය. නොඑසේ නම් ආගමික හා සමාජයයීය වශයෙන් රට දියුණු කිරීමට වඩා වැදගත් තැන අනුවය. කොළඹ අගනුවර විය යුතු යැයි තීරණය කළේ අධිරාජ්‍යවාදීන්ය. ආපසු හැරී බලන විට මෙරට ආක්‍රමණය කළ පෘතුගීසීන්, ලන්දේසීන්, හා ඉංග්‍රීසි ජාතිකයන්ට ලංකාව පහසුවෙන් යටත් කර ගත හැකි වූයේ නැත. යටත් කරගන්නට හැකි වූයේ ඔවුන් සතුව තිබුණ මුහුදු බලය හෙයින්ය. ලංකාව යටත්කර ගත් පසු මෙහි ඇති සම්පත් තම මවු රටවලට ගෙන ගියහ. දෙවනුව මෙරට ඉඩම් වගා කර තම රටවල වෙළඳපොළට අවශ්‍ය කෝපි, තේ හා කුරුඳු නිපදවන්නට පටන් ගත්හ. මිනිරන්, මුතු හා මැණික් එකතු කළහ. මෙම වෙළඳ ද්‍රව්‍ය නැව් ගත කරන්නට බ්‍රිතාන්‍ය ජාතිකයන් තෝරා ගත්තේ කොළඹ වරායයි. කන්ද උඩරට සිට ගෙන ආ යුතු කෝපි හා තේ වෙනුවෙන් මං මාවත් සහ උඩරට දුම්රිය මාවත තැනී ඇත. පහත රට දකුණෙන් එකතු කරන වෙළඳ ද්‍රව්‍ය ගෙන එන්නට පහතරට දුම්රිය මාවත කොළඹ දක්වා තනා ඇත. සංචාරක ව්‍යාපාරය සඳහා ඉතාම ප්‍රයෝජනවත් වටිනා වෙරළ තීරය මෙම මුහුදු බඩ දුම්රිය මාර්ගය වෙනුවෙන් යටවී ඇත. ප්‍රායෝගිකව අපහසු නමුත් ආර්ථිකය නංවන්නට එහි ඇති ප්‍රයෝජනය දකින අවස්ථාවක මේ දුම්රිය මාර්ග වෙනස් කිරීම ගැන අවධානය යොමු කිරීම වටී. බ්‍රිතාන්‍යයන් කොළඹ වරාය පාවිච්චි කළේ වෙළඳාමේ පහසුව වෙනුවෙනි. එහි ඇති පහසුව වූයේ රට මැද සිට හා රටේ විවිධ පළාත් වලින් එකතු කරන ද්‍රව්‍ය පහසුවෙන් තම රටවලට ගෙනයාමට හැකි වීමයි. මේ නිසා කොළඹ කේන්ද්‍ර කරගත් මංමාවත් බිහිවිය. දුම්රිය සේවා ඇති විය. ස්වදේශීකයන් සම්බන්ධකරගත් තැරැව්කරුවන්, ව්‍යාපාරිකයන් හා සැපයුම්කාර ජාලයක් ඒ වෙනුවෙන් බිහිකළේය. එයින් සිදුවූයේ තමන්ට හිතැති ආර්ථික බලවේගයක් සකස් කර ගැනීමයි. එයට අවශ්‍ය පරිපාලනය සිදුවූයේ කොළඹ සිටය. බ්‍රිතාන්‍යයන්ගේ පහසුව නිසා රටේ අගනුවර බවට ලක්වූයේ කොළඹ නගරයයි.

එහෙත් දෙවන ලෝක යුද්ධය පටන් ගන්නා විට කොළඹ වරාය වෙනුවට ත්‍රිකුණාමලය වරාය දෙසට යටත් විජිත පාලකයන් සිය අවධානය යොමු කර තිබේ. රටේ පාලනයට හා වෙළඳාමට කොළඹ වරාය සුදුසු නමුත් ඔවුන්ගේ උපායශීලී වරාය වී ඇත්තේ ත්‍රිකුණාමලයයි. යුද්ධයට මුහුණ දීමට ත්‍රිකුණාමලය සූදානම් කිරීමෙන් එය තහවුරුවෙයි. මිත්‍රපාක්ෂික හමුදාවට අවශ්‍ය ඉන්ධන ගබඩා කරමින්, ඉන්දියන් සාගරය ආරක්ෂා කිරීමට අවශ්‍ය යුධ ශක්තිය මෙහෙයවන්නට බ්‍රිතාන්‍ය ගුවන්, නාවික හමුදා ත්‍රිකුණාමලය ප්‍රයෝජනයට ගත්බව ඉතිහාසය විසින් සනාථ කර ඇති සාක්ෂියකි. වෙළඳාමට සුදුසු වූ කොළඹ ස්වකීය බලය තහවුරු කර ගන්නට හා ආරක්ෂාකර ගන්නට තරම් නොවන බව බ්‍රිතාන්‍ය අවබෝධ කරගෙන ඇත. දෙවන ලෝක යුද්ධයේ දී මිත්‍ර පාක්ෂික රටවලට සිංගප්පූරුව අහිමි වන විට ඉන්දියන් සාගරයේ ආරක්ෂාව වෙනුවෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ලද්දේ ත්‍රිකුණාමලය වරායයි. ලංකාවට නිදහස ලබාදීමෙන් පසුව සියලු සම්බන්ධතා අත්හරින ලද නමුත් 1957 වන තෙක් ත්‍රිකුණාමලය වරායේ අයිතිය තිබුණේ බ්‍රිතාන්‍යය යටතේය.

නිදහස ලබා ගැනීමෙන් පසු මේ යථාර්ථය දකින්නට අප සමත්වූයේ නැත. යටත් විජිත පාලකයන්ට ලැදි රදළ පැලැන්තිය පැවති ක්‍රමය දිගටම පවත්වාගෙන යාම විනා විකල්ප ගැන අවධානය යොමු කළේ නැත. ඒ හෙයින් ගතවූ අවුරුදු හැටක කාලය ඇතුලත ආර්ථික කේන්ද්‍රස්ථානය වූයේ බස්නාහිර පළාතයි. රටේ ආර්ථික විභවය ඇති, ජාත්‍යන්තරයට විවෘත ලක්ෂය ත්‍රිකුණාමලය බව අමතක කළේය.

ත්‍රිකුණාමලය වරාය ලෝකයේ ස්වභාවික වරායන් අතරින් ප්‍රධාන තැනෙක ඇති එකකි. දැනට ලෝකයේ ඇති ඕනෑම විශාල නැවකට එහි ළඟාවිය හැකිය. ශ්‍රී ලංකාව අවට මුහුද ප්‍රයෝජනයට ගන්නා ප්‍රධාන නැව් මාර්ග පහසුවෙන් යා කළ හැකි භූගෝලීය ලක්ෂණ පෙන්නුම් කරයි. ටොලමි ලංකාවට පැමිණ ඇත්තේ මෙම ප්‍රදේශයෙන් බව කියැවේ. සුප්‍රකට දේශ ගවේශක මාර්කෝ පොලෝ මෙම ස්වභාවික වරායෙන් මෙරටට පැමිණ තිබෙන බව ඉතිහාසය දක්වයි. තිරියාය ත්‍රිකුණාමලය වරායට සමීප ප්‍රදේශයකි. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් බුදු රජානන්වහන්සේ ගේ කේශ ධාතූන් රැගෙන මෙරටට පැමිණ ගිරිහඬුසෑය තනවා ඇත්තේ මෙහිය. සේරුවිල පිහිටා ඇත්තේ ද මේ අවට භූමියේය. මුස්ලිම් ප්‍රජාව මෙරට වෙළඳ ගනුදෙනු වලට පැමිණ ඇත්තේ ගෝකන්න වරාය ප්‍රයෝජනයට ගනිමින්ය. පළමුවන පරාක්‍රමබාහු රජතුමා ද ගෝකන්න වරාය රටේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රයෝජනයට ගෙන ඇත. 1650 ගණන් වලදී මෙරට වෙළඳාමට දායක වූ හා ලෝකය සමග යා කළ ස්ථානය හැටියට ගැනෙන්නේ ද ත්‍රිකුණාමය වරායයි. එහි චීන වරායක් ඇත. නෝර්වේ පොයින්ට්

යනුවෙන් හඳුන්වන තැනෙකි. එලිසෙබත් හා ෆෙඩ්රික් යන නම් වලින් හැඳින්වෙන ස්ථාන ඇත. මේ කියන්නේ විවිධ රටවල් හා ජාතීන් එහි ගැවසුන බවය. ප්‍රංශ හමුදාව ද ත්‍රිකුණාමලය වරාය භාවිතාකර ඇත. භූමිය වශයෙන් කොළඹ වරාය මෙන් දස ගුණයක් විශාලත්වය ඇති ත්‍රිකුණාමලය ලෝකයේ හොඳම ස්වභාවික වරාය අතුරින් එකකි.

ත්‍රිකුණාමලය ශ්‍රී ලංකාවේ අගනුවර වීම අවශ්‍ය නැත. පාර්ලිමේන්තුව හා පරිපාලන ක්‍රියාවලිය ජයවර්ධනපුර නගරය තුළ පවත්වාගෙන යා හැකිය. කොළඹ වානිජ නගරයකි. එයට අමතරව ලංකාවේ ආර්ථිකය ප්‍රසාරණය කරමින් විදේශ වෙළඳාම, සංචාරක ව්‍යාපාරය නංවන්නට ත්‍රිකුණාමලයේ පවතින සම්පත් ප්‍රයෝජනයට ගැනීම අනිවාර්ය අවශ්‍යතාවයකි. සිංගප්පූරුවට ත්‍රිකුණාමලයේ ඇති සම්පත් අදටත් නැත. ඩුබායි දේශය කාන්තාරයක් පමණකි. එහෙත් ගතවූ කාලය තුළ මේ රටවල් ලංකාවටත් වඩා ඉදිරියට ගොස් තිබේ. පැරණි රජ දවස එහි අගය ප්‍රින සිටි නමුත් යටත් විජිත පාලකයන් තම අරමුණු උදෙසා ඇති කළ සැලසුම් අදට වලංගු විය යුතු නැත. අධිරාජ්‍යවාදීන් ඇති කළ න්‍යාය පත්‍රයේ තිබුණ දර්ශනය අවබෝධ කර ගත යුතුය. තර්ජන ඇතිවන විට කොළඹ වරාය අත් හැර දමා ත්‍රිකුණාමලය වරාය ප්‍රයෝජනයට ගන්නට බ්‍රිතාන්‍යයන් පෙන්වා දුන්නේ කොළඹ වරාය තම ප්‍රයෝජනයට තාවකාලිකව ප්‍රයෝජනයට ගත් එකක් බවයි. රටක් වශයෙන් තවමත් අප ප්‍රයෝජනයට ගන්නේ බ්‍රිතාන්‍ය තමන්ට තීරණාත්මක අවස්ථාවේ අත්හැර දමන ලද වරාය වීම අවධානය යොමු කළ යුතු කරුණකි. ජගත් ප්‍රජාව සමග රට සම්බන්ධ කරන්නට ඇති ප්‍රමුඛතම ස්ථානය කොළඹ පමණක්ද? ත්‍රිකුණාමලය ගැනත් අවධානය යොමු නොකරන්නේ මන්ද?

එල්.ටී.ටී.ඊ සංවිධානය මුහුදු බලය අතින් ශක්තිමත් වන විට ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ඉන්දියාවට බදු පදනමකින් පවරා එහි ආයෝජනය හා ආරක්ෂාව සලසා ගන්නට ශ්‍රී ලංකාව උපායශීලී විය. තිරිඟු හා සිමෙන්ති ආනයනය කරන්නට පමණක් දැනට ත්‍රිකුණාමලය වරාය ප්‍රයෝජනයට ගැනේ. යුධ, ගුවන් හා නාවික හමුදා ත්‍රිකුණාමලයේ කඳවුරු පවත්වාගෙන යයි. මේ මගින් පළාතට හා රටට අත්පත්ව ඇති ආර්ථික බලය සැලකිය යුතු තරම් නොවේ. දැනට නිකුත්ව ඇති අලුත් සංඛ්‍යා ලේඛන වලට අනුව මෙරට දළ ජාතික නිෂ්පාදනයට බස්නාහිර පළාත රුපියල් බිලියන 2000 ඉක්මවන දායකත්වයක් දක්වන විට නැගෙනහිර පළාතෙන් දක්වන්නේ බිලියන 248ක් පමණකි. සියලු ජාතීන් වෙසෙන, සියලු ආගමික සිද්ධස්ථාන පවතින සහ ජගත් ප්‍රජාවගේ නොමද අවධානයට පහසුවෙන් ලක්කළ හැකි නැගෙනහිර පළාත හා ත්‍රිකුණාමලය දෙස අලුත් කෝණයකින් විමසා බැලිය යුතු අවස්ථාව උදා වී ඇත.

ත්‍රිකුණාමලය වෙනම ආර්ථික කලාපයක් වශයෙන් සංවර්ධනය කළ හැකිය. අපට මෙවැනි අත්දැකීම් තිබේ. මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් බල ප්‍රදේශ සංවර්ධනය කළේ එසේය. මහවැලි අධිකාරිය තවත් එවැනිම අවස්ථාවකි. චීනයට අයත් හොංකොං හි ආර්ථික තීන්දු ගන්නේ වෙනම පසුබිමක් යටතේය. එරට ෂෙන්සෙන් කලාපය වෙළඳ හා ආර්ථික කලාපයක් කිරීමෙන් චීනය ලෝකයේ අවධානය දිනා ගත්තේය. අයර්ලන්තයේ ෂැනොන් කලාපය එවැනි පසුබිමකට යටත් වූ පලාතකි. ඈත අතීතයේ වැනීසියේ සිට මෑත කාලයේ හොංකොං හෝ ඩුබායි දක්වා රටවල් හා නගර ප්‍රබෝධමත් වූයේ ආර්ථික වර්ධනයට ඒවායේ තිබුණ විශේෂ ඉඩකඩ හෙයින්ය. ඩුබායි හි ජෙබෙල් අලි ප්‍රදේශයේ සේවය කරන ලාංකිකයන් එහි ඇති වූ වෙනස ගැන දන්නා වග නිසැකය. ත්‍රිකුණාමලය වැනි තැනක එවැනි පිබිදීමක් වන්නේනම් ඔවුන්ට ඇති අවස්ථා ගැන ඔවුන් සිහින දකිනවා නිසැකය. ත්‍රිකුණාමලයේ ආර්ථික හා සාමාජයීය සංවර්ධනය උදෙසා එවැනි ප්‍රතිපත්ති තීන්දුවක් ගත හැකිය.

මෙයින් අවුරුදු තිහ හතලිහකට කලින් එම තීන්දුව ගන්නට හැකි වූවානම් රටේ ත්‍රස්තවාදයක් බිහිවන්නේ නැත. දකුණේ ත්‍රස්තවාදයට පිළිතුරක් වශයෙන් හම්බන්තොට පුනර්ජීවනයක් ලබයි. උතුරේ ජන ජීවිතය නගා සිටුවන්නට ත්‍රිකුණාමලය සුවිශේෂී තැනකි. එය විශාල ඉඩම් ඇති ප්‍රදේශයකි. මුහුදු වෙරළ ලෝකයේ ආකර්ශණීය තැනකි. වරායට පහසුවෙන් රුවල් නැව් හා සංචාරකයන් ගමන් බිමන් යන නැව් ගෙන්වා ගත හැකිය. ඔවුන්ට උවමනා තවාතැන් හා ආහාරපාන සුලබ කළ හැකිය. මේ අවට ඇති ආගමික ස්ථාන කරා යොමුකළ හැකිවෙයි. ව්‍යාපාර කර්මාන්ත වෙනුවෙන් අවස්ථාව ලබාදෙමින් කොළඹ හා ත්‍රිකුණාමලය අතර අධිවේගී මාර්ගයක්, ගුවන් හා මුහුදු ප්‍රවාහන සේවා ඇති කිරීමත් අලුතින් කළ හැකි දේය. ඛනිජතෙල් මිළ ඉහල යමින් පවතින අවස්ථාවක

එහි ගබඩා, පිරිපහදුව හා තෙල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදන වෙනුවෙන් පරිසරය ආරක්ෂා කරගෙන අවස්ථාව සැපයිය හැකිය. මේවාට අවශ්‍ය යටිතල පහසුකම් නංවන අතර ලෝකයම වේගයෙන් ගමන්කරන තොරතුරු තාක්ෂණය උදෙසා ත්‍රිකුණාමලයේ අලුත් අවකාශයක් බිහිකරන්නට අවස්ථාව තිබේ. නාවික හමුදා මූලස්ථානය මෙම ප්‍රදේශයට ගෙන යා හැකිවේ. උපාය මාර්ගික වශයෙන් මෙවැනි ආරක්ෂක අංශ ස්ථාපිත විය යුතු ඒ වෙනුවෙන් පහසුකම් ඇති ස්ථානවල විනා අගනුවර හෝ තදාසන්න ප්‍රදේශවල නොවේ. රජයේ අමාත්‍යංශ කිහිපයක් මෙම පළාත කේන්ද්‍ර කරගෙන පවත්වාගෙන යා හැකිය. මේ මගින් අවස්ථා බිහිවෙයි. නව ව්‍යාපාර ඇතිවෙයි. ව්‍යාපාර හා සේවා ජනනය වන විට ආර්ථිකය ප්‍රසාරණයක් අපේක්ෂා කළ හැකිය. යුද්ධයෙන් පසු තවමත් සැලසුම් කරමින් සිටින අවස්ථාවක මේ ගැන සහමුලින්ම විකල්ප යෝජනා ඇතිව අවධානය යොමු කරන්නට ඉඩ තිබේ. අලුතින් සිතා අලුත් ආකල්ප අනුව ත්‍රිකුණාමලය දෙස බලන්නට රජයේ සූදානමක් ඇත්නම් එය මෙරට ආර්ථිකයේ වර්ධනයට දක්වන දැවැන්ත පිටුවහලක්වනු නො අනුමානය.

දැනට මෙම ප්‍රදේශයේ වැඩි අවස්ථා ඇත්තේ ආරක්ෂක හමුදා සතුවය. සාමකාමී අවස්ථාව සමග ත්‍රිවිධ හමුදාව සතු අත්දැකීම් මානව සම්පත් හා ඉඩම් යනාදිය පෞද්ගලික අංශය හා එක්ව හවුල් ව්‍යාපාර ලෙස ආයෝජනය කරන්නට හැකිය. එය මේ බලාපොරොත්තු සහගත වර්ධනයට එකතුකළ හැකි ශක්තියකි.

අධ්‍යයනය කරන විට ලෝකයේ දියුණු වූ රටවලට ශක්තිමත් පදනමක් ව ඇත්තේ කිසියම් වෙනස්කමක් මගින් සිදුවූ සමාජ විපර්යාසයක් බව පැහැදිලිව පෙනී යන කරුණකි. ඉතිහාසයෙන් ඉදිරිපත්වන සාක්ෂි අනුව වෙළඳාම හා වරාය ආශ්‍රිත සේවා වෙනුවෙන් ත්‍රිකුණාමලයේ ඇති පිහිටීම රටට වැදගත් එකකි. අධිරාජ්‍යවාදීන් විසින් සිය වෙළඳාම වෙනුවෙන් කොළඹ ගොඩ නැගූ නමුත් නිදහස් ලංකාව මෙකී අරමුණට විකල්පව අවධානය යොමු කළ යුතුව තිබේ. උතුර දකුණ වෙනසක් නැතිව වේගයෙන් දියුණු කළ යුතු අවස්ථාවක මෙවැනි අලුත් දේ ගැන අවධානය යොමු කළ යුතුය. අතීත අත්දැකීම් පදනම් කරගෙන අනාගතය ගොඩනැගීම ඉතාමත් වැදගත්ය.